**RAJARATA UNIVERSITY OF SRI LANKA**
**Centre for Distance and Continuing Education (CDCE)**

# DIPLOMA IN ENGLISH (EXTENSION) - YEAR 2024/2025(INTAKE 24)

**(Online or Physical mode) conducted by**
**Department of English Language Teaching**
**Faculty of Social Sciences & Humanities**

ඉහත පාඨමාලාව සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියාවල නියුක්තියන්ගෙන් සහ පාසල් හැර ගිය සිසුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත ප්‍රවේශ සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**A.** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය **හෝ** එයට සමාන විභාගයක් **හෝ** ජාතික වෘත්තීය යෝග්‍යතා NVQ) 4 වන **මට්ටම හෝ** ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF) 2 වන **මට්ටමට** සමාන පාඨමාලාවක් සමත් වීම.

**සහ**

a. අ.පො.ස (උ/පෙළ) සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය සඳහා සාමාර්ථයක් (S) **හෝ**
b. අ.පො.ස (සා/පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් (C) **හෝ**
c. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් පිරිනැමීම සඳහා අවශ්‍යතාවයක් ලෙස උගන්වනු ලබන අනිවාර්ය ඉංග්‍රීසි විෂයය සඳහා සාමාර්ථයක් **හෝ**
d. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ජාතික සහතිකය (NCE) **හෝ**
e. පිළිගත් විශ්ව විද්‍යාලයක මූලික හෝ වෘත්තීය ඉංග්‍රීසි සහතිකය **හෝ**
f. පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංග්‍රීසි මාධ්‍ය උපාධියක් **හෝ**
අධ්‍යයන මණ්ඩලය විසින්, වෙන් වෙන් වශයෙන් ඇගයීම මත, සුදුසු යැයි සැලකිය හැකි සහ සනාතන සභාවට පිළිගත හැකි වෙනත් ඕනෑම සුදුසුකමක්. **හෝ**

**B.** පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් සහතික පත්‍රයක්

මීට අමතරව, අපේක්ෂකයින් විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන ලිඛිත හෝ වාචික තේරීම් පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

**කාල සීමාව**
වසරක කාලයකි (සෙනසුරාදා හෝ ඉරිදා)

**පාඨමාලාව**
මෙම පාඨමාලාවට **සවන්දීම** , කථනය, කියවීම සහ ලිවීමේ කුසලතා සහ ව්‍යාකරණ **මෙන්ම ඉංග්‍රීසි සාහිත්‍යයද** ඇතුළත් වේ. අපේක්ෂකයාගේ කැමැත්ත අනුව භෞතිකව විශ්ව විද්‍යාලය තුළදී හෝ මාර්ගගත ආකාරයෙන් පාඨමාලාවට සම්බන්ධ විය හැක. **සියළුම** විභාග විශ්ව විද්‍යාලය තුළ භෞතිකව පවත්වනු ලැබේ.

**ගාස්තු**
පාඨමාලා ගාස්තුව - රු. 30,000/= **විභාග ගාස්තුව** රු. 2500/= ලියාපදිංචිවීමේ ගාස්තුව - රු. 1000/= **සම්පූර්ණ ගාස්තුව** රු. 33,500/= (**වාරික 2කින් ගෙවිය හැක**: රු. 21,000/=+රු. 12, 500/=)

**අයදුම්පත්**
අයදුම්පත් සහ වැඩිදුර තොරතුරු www.rjt.ac.lk/notice හෝ cdce.rjt.ac.lk/cdce/news.php යන වෙබ් අඩවිවලින් බාගත කළ හැකි අතර පුද්ගලිකව පැමිණීමෙන් ද ලබාගත හැක. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, **නියෝජ්‍ය ලේඛකාධිකාරී, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය** යන ලිපිනයට තැපෑලෙන් එවිය යුතුය. (**අයදුම්පත සමග** උප්පැන්න සහතිකයේ සහ අදාළ ප්‍රවේශ සුදුසුකම් වල පිටපත් අමුණා එවිය යුතුය )

අයදුම්පත සමග තෝරා ගැනීමේ පරීක්ෂණ ගාස්තු වශයෙන් ලංකා බැංකුවේ මිහින්තලය ශාඛාවේ, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය නමින් පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 5022233 වෙත රුපියල් **500.00** ක මුදලක් බැර කර (ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගෙවීම් කළ හැක) ලබා ගන්නා බැංකු ලදුපතද එවිය යුතුය.

**අයදුම් පත් භාර ගැනීමේ අවසන් දිනය: 14.06.2024**

***විමසීම්:*** *සම්බන්ධිකාරක 0716858691, 0714349191*
*ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යනාංශය - 025 -2266802*
*දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය - 025 – 2260120*

**ලේඛකාධිකාරී**
**ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය**
**මිහින්තලය**
**18.02.2024**

tamilguru.lk